# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 231/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 09/02/2024<br>පැය 0550 |

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මනුෂ්‍ය ඝාතනයක් - මූතූර් පොලිස් වසම.**

2024.02.08 වන දින උදෑසන කාලයේ මූතූර් පොලිස් වසමේ අල්ලේ නගර්, තෝප්පූර් 07 ප්‍රදේශයේ නිවසක් තුළ කාන්තාවක් ඝාතනය කර ඇති බවට මූතූර් පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 28 ක් වන අල්ලේ නගර්, තෝප්පූර් ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

2024.02.07 වන දින රාත්‍රී කාලයත් 2024.02.08 වන දින උදෑසන කාලයත් අතර මෙම ඝාතනය සිදුව ඇති අතර පවුල් ආරවුලක් හේතුවෙන් මරණකාරියගේ පුරුෂයා විසින් මෙම ඝාතනය සිදු කර ඇති බවත් සැකකරු විසින් මරණකාරිය ගෙල පැලද සිටි සෝල් එක ආධාරයෙන් ගෙල සිරකර මෙම ඝාතනය සිදුකර ඇති බවද විමර්ශන වලදී අනාවරණය වී ඇත. ඝාතනය සිදුකල වයස අවුරුදු 33 ක් වූ සැකකාර සැමියා මූතූර් පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

මූතූර් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. නිවසක් තුළ සැකකටයුතු ලෙස අඹු සැමි යුවලක් මියයාමක් - මිරිහාන පොලිස් වසම.**

2024.02.08 වන දින මිරිහාන පොලිස් වසමේ ජුබිලි මාවත, මිරිහාන ප්‍රදේශයේ නිවසක දින කිහිපයක සිට දුගඳක් හමන බවට අසල් වැසියෙකු විසින් මිරිහාන පොලිස් ස්ථානය දැනුවත් කිරීමෙන් පසු ඒ සම්බන්දයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇත. පොලිස් ස්ථානයේ නිලධාරින් එම නිවසට ගොස් පරීක්ෂා කිරීමේදී නිවසේ කාමරයක ඇදක් මත දින කිහිපයකට පෙර මියගිය නරක්වූ පිරිමි පුද්ගලයෙකුගේ මෘත ශරීරයක් ද, එම නිවසේ මුළුතැන්ගෙයි බිම නිරුවත් කාන්තාවකගේ මෘත ශරීරයක් තිබී පොලිසිය විසින් සොයාගෙන ඇත.

**මෙලෙස මියගොස් ඇති පිරිමි පුද්ගලයා අවුරුදු 80 ක් වන අතර, කාන්තාව වයස අවුරුදු 96 ක් වන ඉහත නිවසේ පදිංචිව සිටි අඹු සැමි යුවලක් බවට දැනට සිදුකල විමර්ශන වලදී අනාවරණය වී ඇත.**

මෘත ශරීර සම්බන්ධයෙන් නුගේගොඩ ගරු මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර, පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකිරීම සඳහා මෘත ශරීර කළුබෝවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත.

මෙය අපරාධයක් ද නැතහොත් ස්වාභාවික මරණයක් ද යන්න පිළිබඳ මිරිහාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **ටී 56 වර්ගයේ ගිනි අවියක් සහ ජීව උණ්ඩ සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.02.08 වන දින සවස් කාලයේ කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව හැගල්ල, කොස්ගොඩ ප්‍රදේශයේ සිදුකරන ලද වැටලීමකදී **ටී 56 වර්ගයේ ගිනි අවියක් මැගසින් 01 ක්, ජීව උණ්ඩ 32 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන කොස්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දැනට විදේශගතව සිටින සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයකු විසින් සැකකරුට මෙම අවිය ලබාදී ඇති බවට අනාවරණය වී ඇති අතර, මෙම අවිය යොදාගෙන අපරාධ සිදුකර ඇත්ද යන්න සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **රජයේ රැකියා ලබා දෙන බව පවසා ව්‍යාජ ලිපි සකස් කිරීම හා වංචා කිරීම සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විශේෂ විමර්ශන අංශය.**

රජයේ රැකියා ලබා දෙන බවට පවසා රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලිපි ශීර්ෂ භාවිතා කරමින් ව්‍යාජ ලිපි සකස් කිරීම හා වංචා කිරීමක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විශේෂ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් 2024.02.08 වන දින උදෑසන කාලයේ මෙම වංචාවට සම්බන්ධ සැකකරුවෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන මීපාවල, පෝද්දල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විශේෂ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05.** **රන් මාල හා දේපල කොල්ලකෑමේ අපරාධයන්ට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.**

ගල්කිස්ස පොලිස් ස්ථානයට වාර්තා වී තිබූ රන්මාල හා දේපල කොල්ලකෑමේ අපරාධයන් ගනනාවක් සම්බන්ධයෙන් බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් විමර්ශනය සිදුකර 2024.02.08 වන දින දහවල් කාලයේ අඟුලාන පොලිස් වසමේ සයුර නිවාස සංකීර්ණය ඉදිරිපිටදී සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.
**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන අඟුලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අත්අඩංගුවට ගත් සැකකරුවන්ගෙන් සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී ගල්කිස්ස පොලිස් වසමේදී කොල්ලකන ලද රන් පෙන්ඩනයක් හා ජංගම දුරකථන 02ක් සොයාගෙන ඇති අතර, බලපිටිය හා මොරටුව යන අධිකරණ වල විභාග වන නඩු 05 ක් සඳහා වරෙන්තු නිකුත් වී ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය විය.

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි

**06. අපරාධ ගණනාවකට අවශ්‍යකර සිටි සැකකරුවන් 04 දෙනෙකු අත්අඩංගුවට - මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය.**

පමුණුගම පොලිස් ස්ථානයට වාර්ථා වූ තියුණු ආයුධ වලින් කපා කොටා පොලු වලින් පහරදී පුද්ගලයින් තිදෙනෙකුට තුවාල සිදුකර ඔවුන් සතුව තිබූ රුපියල් 742,000/- ක මුදල් හා දේපල කොල්ලකෑම හා ජාඇල පොලිස් ස්ථානයට වාර්ථා වී තිබූ යතුරුපැදියක් සොරකම් කිරීම යන අපරාධ වලට අවශ්‍ය කර සිටි විවෘත වරෙන්තු නිකුත් වී තිබූ සැකකරුවන් සිව් දෙනෙකු මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන් විසින් 2024.02.08 වන දින උදෑසන කාලයේදී ජාඇල හා බියගම ප්‍රදේශ වලදී අත්අඩංගුවට ගෙන පමුණුගම පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 ත් 41 ත් තඅර වයස් වල පසුවන කැළණිය හා ජාඇල ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**07. තීරුබදු නොගෙවා මෙරටට ගෙන්වන ලද රත්තරං ගුලියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.02.08 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බාන්ස් ඇවනිවු හන්දියේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලැබී තිබූ තොරතුරකට අනුව තීරුබදු නොගෙවා මෙරටට ගෙන්වන ලද ග්‍රෑම් 460 ක බර රත්තරං ගුලියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන හුනුපිටිය, වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**08. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය.**

2024.02.08 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය නිලධාරීන්ට ලැබී තිබූ තොරතුරකට අනුව **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 300 සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 46ක් වන බඩෝවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**09. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දෙමටගොඩ පොලිස් ස්ථානය.**

2024.02.08 වන දින සවස් කාලයේ දෙමටගොඩ පොලිස් වසමේ ලක්හිරු සෙවන බී මහල් නිවාසය තුලදී දෙමටගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 150 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන මාලිගාවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙමටගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**10. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මට්ටක්කුලිය පොලිස් ස්ථානය.**

2024.02.08 වන දින රාත්‍රී කාලයේ මට්ටක්කුලිය පොලිස් වසමේ සමිත්පුර සී පටුමග අසලදී මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 50 මිලිග්‍රෑම් 520 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙමටගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**11. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පුදුකුඩිඉරිප්පු පොලිස් ස්ථානය.**

2024.02.08 වන දින සවස් කාලයේ පුදුකුඩිඉරිප්පු පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව 12 කණුව ප්‍රදේශයේ සිදුකරන ලද වැටලීමකදී **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන විශ්වමඩු ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුදුකුඩිඉරිප්පු පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ආරුගම්බේ විශේෂ කාර්ය ලබකා කඳවුර.**

2024.02.09 වන දින අළුයම් කාලයේ පොතුවිල් පොලිස් වසමේ පොත්තාන ඌරණි රජයේ කැලෑව තුලදී ආරුගම්බේ විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව සිදුකරන ලද වැටලීමකදී **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන පොතුවිල් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත්කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන පොතුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොතුවිල් පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. රන් මාල කොල්ලකෑමට සම්බන්ධ සැකකරුවන් සිව්දෙනෙකු අත්අඩංගුවට - රාගම පොලිස් ස්ථානය.**

2024.02.08 වන දින රාගම පොලිස් වසමේ ගණේමුල්ල ප්‍රදේශයේදී රාගම පොලිස් ස්ථානයේ නිලධාරින් විසින් ලද තොරතුරකට අනුව රන් මාල කොල්ලකෑම සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ සැකකරු සන්තකයේ තිබී හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සොයාගෙන ඇති අතර සැකකරුගෙන් අනාවරණය කරගත් තොරතුරුවලට අනුව රන් භාණ්ඩ කොල්ලකෑමට ආධාර අනුබල දුන් තවත් සැකකරුවන් තිදෙනෙකු විමර්ශන නිලධාරින් විසින් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 22, 28, 39 ක් වූ කඩවත සහ ගනේමුල්ල ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන්ගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීම්වලදී මොවුන් විසින් රාගම පොලිස් වසමේදී කොල්ලකන ලද රන් මාලයක්, පෙන්ඩන්ට් එකක්, කොල්ලකෑමට යොදාගත් යතුරු පැදි දෙකක් පොලිසිය විසින් සොයාගෙන ඇත. රාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 14. දියේ ගිලී කාන්තාවක් මියයාම - කන්දකැටිය පොලිස් ස්ථානය.

2024.02.08 වන දින උදෑසන කාලයේ දී කන්දකැටිය පොලිස් වසමේ බුබුල, දඩයම්තලාව ඇලේ කාන්තාවක් මියගොස් ඇලේ ගසාගෙන යන බවට කන්දකැටිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 72 ක් වන බදුලුඔය, කන්දකැටිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය පදිංචිව සිටි නිවසේ සිට කිලෝ මීටර් 02 ක් පමණ දුරින් පිහිටි හේනක ගොවිතැන් කරමින් සිටි ඇගේ පුරුෂයා හා තවත් පිරිසක් සඳහා උදෑසන ආහාරය රැගෙන දඩයම්තලාව ඇලෙන් එගොඩවීමට ඇති ඒදණ්ඩකින් එගොඩ වන අවස්ථාවේදී ඇලට ඇද වැටී ගසාගෙන ගොස් ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශාරිරය ඇලෙහි තිබී සොයාගෙන ඇති අතර කන්දකැටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. අනවසර විදුලි රැහැනක ගැටී වන අලියෙකු මියයාම හා එම විදුලි රැහැන අදින ලද පුද්ගලයින් දෙදෙනෙකු අත්අඩංගුවට - පුලියන්කුලම පොලිස් ස්ථානය.

2024.02.08 වන දින පුලියන්කුලම පොලිස් වසමේ පලෛයිවාඩි තම්බාගාම් නැමති පුද්ගලික ඉඩමකට අයත් කුඹුරු යායක වන අලියෙකු මියගොස් ඇති බවට පුලියන්කුලම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 13 ත් 15 අතර උස අඩි 10 ක් පමණ වන පිරිමි සතෙක් වන අතර, සිදුකල විමර්ශනයේදී අනවසරයෙන් ඇද තිබූ විදුලි රැහැනක ගැටී විදුලි සැර වැදී මෙම අලියා මියගොස් ඇති බවට අනාවරණය වී ඇත. ඒ අනුව මෙම අනවසර විදුලි රැහැන අදින ලද බවට සැක කරන පුලියන්කුලම හා ඇඹිලිපිටිය ප්‍රදේශයේ පදිංචි පුද්ගලයින් දෙදෙනෙකු වන සංරක්ෂණ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

වව්නියාව අඩවි වන නිලධාරීන් හා පුලියන්කුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 16. මාරක රිය අනතුරක් - කතරගම පොලිස් වසම.

2024.02.08 වන දින සවස් කාලයේ කතරගම පොලිස් වසමේ කතරගම සෙල්ලකතරගම මාර්ගයේ කිලෝමීටර් 03 කණුව අසලදී සෙල්ලකතරගම දෙස සිට කතරගම දෙසට ධාවනය වූ ලොරි රථයක් රියදුරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන කොන්ක්‍රීට් කණුවක හා ගසක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ලොරි රථයේ රියදුරු කතරගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 27 ක් වන වීරවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දෙබරවැව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කතරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**